LANKABARANA
Astrology Services

Tel: +942702788
E-mail: barana1950@yahoo.com
Web: lankabarana.com

නම ..................................................

අංකය ..................................................

ස්ත්‍රී




පුරුෂ




| | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|
| උපන් දිනය | 1986.12.07 | 1981.09.03 |
| උපන් වේලාව | පෙ.ව/ප.ව 11.42 | පෙ.ව/ප.ව 02.45 |
| දවස | ඉරිදා | බ්‍රහස්පතින්දා |
| නැකත | ශ්‍රාවණ | හස්ත |
| උපන් ස්ථානය | මහනුවර | ගම්පොළ |

## ග්‍රහ පිහිටීම

| | | |
|---|---|---|
| රවි | 21.40 | 17.11 |
| චන්ද්‍ර | 14.26 | 12.34 |
| කුජ | 14.15 | 07.14 |
| බුධ | 03.10 | 07.05 |
| ගුරු | 20.44 | 18.33 |
| ශුක්‍ර | 13.45 | 25.00 |
| ශනි | 18.54 | 15.19 |
| රාහු | 24.06 | 05.55 |
| කේතු | 24.06 | 05.55 |

LANKABARANA

LANKABARANA
Astrology Services

Tel: +942702788
E-mail: barana1950@yahoo.com
Web: lankabarana.com

| පොරොන්දම | ස්ත්‍රී | පුරුෂ | ශුභ | අශුභ |
|---|---|---|---|---|
| නැකත් | සියාවස | පුස | — | අශුභයි |
| ගණ | රාක්ෂ | දේව | — | අශුභයි |
| මහේන්ද්‍ර | සියාවස | පුස | ශුභයි | — |
| ස්ත්‍රීදීර්ඝ | සියාවස | පුස | ශුභයි | — |
| යෝනි | අශ්ව | බැටළු | ශුභයි | — |
| රාශි | කුම්භ | කටක | ශුභයි | — |
| රාශ්‍යාධිපති | ශනි | චන්ද්‍ර | ශුභයි | — |
| වශ්‍ය | සියාවස | පුස | ශුභයි | — |
| රජ්ජු | කණ්ඨ | කණ්ඨ | — | අශුභයි |
| වේධ | සියාවස | පුස | ශුභයි | — |
| වෘක්ෂ | කොළොම | කුඹුක් | — | අශුභයි |
| ආයු | සියාවස | පුස | ශුභයි | — |
| පක්ෂි | බකමූණා | කපුටා | ශුභයි | — |
| භූත | ආකාශ | තේජෝ | ශුභයි | — |
| ගෝත්‍ර | කාශ්‍යප | ආංගිරස | ශුභයි | — |
| වර්ණ | ක්ෂත්‍රිය | වෛශ්‍ය | ශුභයි | — |
| ලිංග | නපුංසක | පුරුෂ | — | අශුභයි |
| නාඩි | ආද්‍ය | මධ්‍ය | ශුභයි | — |
| දින | ශනි | චන්ද්‍ර | ශුභයි | — |
| ගුණ | සියාවස | පුස | ශුභයි | — |

ශුභ පොරොන්දම් ගණන ......15......

අශුභ පොරොන්දම් ගණන ......05......

ප්‍රතිශතය ......75%......

LANKABARANA

## අඟහරුගේ දෝෂ තත්ත්වය

ස්ත්‍රී කේන්ද්‍රයේ හත් වැන්න තුළ අඟහරු තැන්පත්ව සිටින අතර පුරුෂ කේන්ද්‍රයේ අඟහරු අට වැන්නේය. මෙම ස්ථාන දෙක විවාහය සම්බන්ධයෙන් ඍජු බලයක් පවතී. මෙම දෙදෙනාම උත්පත්තිය ලබා ඇත්තේ අඟහරුවාදා දවස් තුලය. එබැවින් අඟහරු බල තත්ත්වය වැඩි කෙරේ. සමාන තත්ත්වයෙන් පසුවන හෙයින් ලග්න කේන්ද්‍රය තුලින් අඟහරු දෝෂ තත්ත්වය අවසන් කෙරේ. මෙම දෝෂ තත්ත්වය චන්ද්‍ර ලග්නය කෙරෙන්ද විමසිය යුතුය.

දෙදෙනාගේම චන්ද්‍ර ලග්නය කෙරෙන් දෙවැන්න තුල අඟහරු තැන්පත්ව ඇත. මෙම ස්ථාන ලග්න කේන්ද්‍රයේ හත් වැන්න හා අට වැන්නයි. එබැවින් මෙම දෝෂ තත්ත්වයද අවසන් කෙරේ. මෙම කේන්ද්‍ර යුගලයේ අඟහරු දෝෂ තත්ත්වය නිසි ආකාරයෙන් අවසන් වීම වඩාත් යහපත් කාරණයකි.

## ග්‍රහ තත්ත්වය

මෙම කේන්ද්‍ර යුගලයේ අඟහරු හා සෙනසුරු අතර සම්බන්ධතා හෝ දෘෂ්ටි ඇති නොකරයි. පුරුෂ කේන්ද්‍රයේ සෙනසුරු පස් වැන්න තුල තැන්පත්ව ඇත්තේ 00.28 අංශකයේ බැවින් සෙනසුරුගේ බල තත්වය පවතින්නේ හතර වැන්න තුලය. මේ අනුව බලන විට දෙදෙනාගේම සෙනසුරු ගෙන් පස් වැන්න තුල අඟහරු තැන්පත්ව ඇත. දෙදෙනාගේම විවාහයට බලපාන ස්ථාන තුල අඟහරු සිටී. දෙදෙනාගේම විවාහයට බලපාන ස්ථාන තුල අඟහරු සිටී. දෙදෙනාගේම චන්ද්‍රයා තැන්පත්ව ඇත්තේ සෙනසුරු රාශි තුලය. එබැවින් චන්ද්‍රයාගේ බල තත්ත්වය සමාන ආකාරයෙන් යුක්ත වේ.

මෙහි වෙනත් ග්‍රහබල උසස් හෙයින් එය විවාහයට බාධාවක් නොවේ. ස්ත්‍රී කේන්ද්‍රයේ කාලසර්ප යෝගය ඇති වුවද පුරුෂ කේන්ද්‍රයේ කාලසර්ප යෝගයට ආසන්න ග්‍රහ තත්ත්වය ඇත එබැවින් සමාන තත්ත්වයක් පවතී. මෙහි හත් වැන්න දෙදෙනාගේම වෙනත් ග්‍රහයින්ගේ දෘෂ්ටි බල තත්ත්වයට යටත් නොවේ.

දෙදෙනාගේම ලග්නාධිපතියන් තැන්පත්ව ඇත්තේ සෙනසුරුගේ රාශි වලය. මෙම කේන්ද්‍ර යුගලයේ ලග්නාධිපතියන් මිත්‍ර තත්ත්වයට පත්ව ඇත.

දෙදෙනාගේම රාශි බලය වෙනස් තත්ත්වයකින් පසු වුවද සිකුරු ස්ථාන වශයෙන් දෙදෙනාගේම හත් වැන්න තුල තැන්පත්ව ඇත. මෙම කේන්ද්‍ර යුගලයේ මෙවැනි සමාන තත්ත්වයක් පවතී.

ලිංගික ජීවිතය හා චෛතසික තත්ත්වය.

දෙදෙනාගේම චන්ද්‍රයා ගෙන් දෙවැන්න තුල අඟහරු තැන්පත්ව ඇත. මෙම පිහිටීම් විවාහයට සම්බන්ධ  ස්ථාන තුලය. ස්ත්‍රී කේන්ද්‍රයේ  අඟහරු සමග සිකුරු හත් වැන්න තුල තැන්පත්ව ඇත්තේ බ්‍රහස්පතීගේ රාශියක් තුලය. පුරුෂ කේන්ද්‍රයේ චන්ද්‍රයා සිකුරු සමග හත් වැන්න තුල තැන්පත්ව ඇත්තේ සෙනසුරුගේ රාශියක් තුලය. මෙම සිකුරු මෙසේ සෙනසුරු හා බ්‍රහස්පතී හිමි රාශි වල තැන්පත් වූ විට ඔවුන්ගේ බල තත්ත්වය අයහපත් ආකාරයට ක්‍රියාත්මක නොවේ. මෙවැනි තත්ත්වයක් පවත්නා විට ලිංගික ජීවිතයේ අවශ්‍යතාවයන් සමාන තත්ත්වයෙන් පවතී. කුජ සිකුරු හා සඳු සිකුරු යෝග දෙක බොහෝ අවස්ථා වලදී සමාන තත්ත්වයෙන් ක්‍රියාත්මක වන හෙයින් ලිංගික ජීවිතය සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් ඇති නොවේ. උත්පත්තියේදීම ලග්නාධිපතියන් මිත්‍ර තත්ත්වයට පත් වීම හා චන්ද්‍රයා සමාන තත්ත්වයෙන් පසුවේ. මෙහි හතර වැන්න අධිපතියන් වන්නේ බ්‍රහස්පතී හා සිකුරුය. මෙවැනි තත්ත්වයන් පවතින විට අදහස් වල සමානත්වයක් ඇති කරයි.

නිර්දේශය හා වෙනත් කරුණු

මෙහි අඟහරු දෝෂ තත්ත්වයක් අවසන් වී ඇත. ග්‍රහ තත්ත්වය තුල සමානත්වයක් ඇති කරයි. අදහස් හා ලිංගික ජීවිතය සමානය. මෙම කේන්ද්‍ර යුගලයේ පස් වැන්න හිමි වන්නේ සෙනසුරුට හා අඟහරුටය. එහෙත් දෙදෙනාගේ පස් වැන්නේ ග්‍රහ ඵලය උසස් කෙරේ. එබැවින් විවාහ වූ අලුත දරු සම්පත් ඇතිකර ගැනීමට කටයුතු කළ යුතුය. මෙම කරුණු සියල්ල සලකා බලන විට මෙම දෙදෙනා අතර විවාහය සිදු කිරීම යෝග්‍ය හෙයින් නිර්දේශ කරමි.

2012.03.12

ශුභ මංගලම්